# open house colombo

## උද්‍යාන සහ හරිත අවකාශ

## 23–24 සහ 30–31 මාර්තු 2024

Open House Colombo යනු විවිධ උත්සව සහ අවස්ථාවන් ඔස්සේ යමින් ගෘහ නිර්මාණ ශිල්පය සහ නිර්මාණ සැලසුම් වඩාත් හොඳින් ප්‍රවේශ කළ හැකි ලෙස සකසනු සඳහා කැපවූ Open House නම් ලෝක ව්‍යාප්ත සංවිධාන ජාලයක කොටසකි. Open House ලෝක ව්‍යාප්තිය, අන්තර් ක්‍රියාකාරීත්වය ඔස්සේ අද්විතීය නාගරික ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමුකරයි. එනම්, පිවිසීම සඳහා වඩාත් අභියෝගාත්මක විය හැකි අවකාශ සම්බන්ධ තොරතුරු නාමිකව ලබාදෙයි. 2022 දී කොළඹ පැවති Open House පළමු වැඩසටහනේ සිට ජෙෆ්රි බාවා භාරය එහි ප්‍රාදේශීය සංවිධායකයා බවට පත්ව සිටී. කොළඹ Open House, ජෙෆ්රි බාවා, මිනෙට් ද සිල්වා, ජස්ටින් සමරසේකර, පානිනි තෙන්නකෝන් සහ වැලන්ටයින් ගුණසේකර ඇතුළු ගෘහ නිර්මාණ ශිල්පීන් නිමැවූ ගොඩනැගිලිවලින් උපලක්ෂිත විය.

උද්‍යානයේ 75 වැනි සංවත්සරය හා සබැඳිව බාවා භාරය ක්‍රියාත්මක කරන්නා වූ බහුවිධ වාර සැමරුම වන ‘ලුණුගඟ වෙත’ යන තේමාව අනුව යමින්, Open House Colombo 2024 හි තේමාව බවට පත්ව ඇත්තේ, “උද්‍යාන සහ හරිත අවකාශ” යන්නයි. 2023 වසරෙහි බෙන්තොට දී පැවති Open House වැඩසටහන එම තේමාවෙන් ම යුතු වූ අතර, ලුණුගඟ, ඊනා ද සිල්වා නිවස, Boutique 87, Heritance Ayurveda ඔසු නිකේතනය සහ බෙවිස් බාවාගේ Brief උද්‍යානය ඇතුළු අවකාශ වෙත ඉඩකඩ විවර කෙරිණි. නැරඹිය යුත්තේ කොහේදැයි ඔබ දන්නේ නම්,  සැඟව ගිය හරිත අවකාශ ගහනව පවතින කොළඹ පුරවරයට මෙම තේමාව රැගෙන ඒම පිළිබඳව අපි ඉමහත් සතුටට පත්වන්නෙමු!

වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා කරුණාකර පහත සබැඳි වෙත පිවිසෙන්න:
ලියාපදිංචිය: bit.ly/ohc2024
ජෙෆ්රි බාවා භාරය සංවිධානය කරන අවස්ථා: geoffreybawa.com/events
Open House Colombo වෙබ් අඩවිය: openhouseworldwide.org/colombo

@openhousecolombo සහ @geoffreybawatrust යන Instagram ගිණුම් හරහා අප සමඟ සම්බන්ධවන්න.

## සූදානම

Open House වැඩසටහනේ දින ඉතා විනෝදජනක ය. එහෙත් ඒ දින දිගු විය හැකි අතර, එළිමහනේ වැඩිපුර කාලයක් ගතකිරීම අවැසි වේ. විශේෂයෙන් මේ විශේෂ "හරිත අවකාශ" වැඩසහටන සඳහා! එබැවින් අපි ඔබට නිර්දේශ කරනුයේ:

- සිරුර සජලනය වන සේ පවත්වාගන්න (නිතර ජලය පානය කරන්න): ඔබේ ම වතුර බෝතලයක් රැගෙන එන්න.
- හිරු එළියෙන් ආරක්ෂා වන්න: තොප්පියක් හෝ කුඩා හිස්වැස්මක් පළඳින්න. හිරු ආවරණය කෙරෙන ක්‍රීම් ගල්වන්න.
- වර්ෂාව ඇතිවිය හැකිය: බෑගයෙහි කුඩයක් අසුරා තබාගන්න.
- මදුරු දෂ්ටනය වළක්වාගන්න: කෘමි විකර්ශක දියර ඉසින්න.
- විශේෂ අවස්ථා සඳහා ඇඳ පැළඳ සිටින්න: සුවපහසුව දනවන ඇඳුම් සහ සවිමත් පාවහන් තෝරාගන්න.

## කාලසටහන

නිදහස් ප්‍රවේශයන් සහ ගමන් වාර පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා, අපගේ Eventbrite: bit.ly/ohc2024 සබැඳිය වෙත පිවිසෙන්න.

### පළමු සති අන්තය: 23rd–24th March

| නැරඹුම් ස්ථාන | වාස්තු විද්‍යාඥයා | විවෘත දිනය | ලිපිනය |
|---|---|---|---|
| ද සොයිසා නිවස | ජෙෆ්රි බාවා | 23rd March | අංක 61/5, ධර්මපාල මාවත, කොළඹ 07 |
| සාර නිල්ල | අමිල ද මෙල් | 23rd March | අංක 30/8, 6 වන පටුමග, කොළඹ 05, කිරුළපන |
| ගෝර්ඩන් උද්‍යාන | ශ්‍රීමත් ආතර් ගෝර්ඩන් | 24th March | ජනාධිපති මන්දිරය, ජනාධිපති මාවත, කොළඹ 01 |
| ලක්මහල් ප්‍රජා පුස්තකාලය | නොදනී | 24th March | 8A, ඇල්ෆ්‍රඩ් නිවාස පාර, කොළඹ 03 |
| ජීවමාන ගැලවුම්කරු ක්‍රිස්තුස්ගේ ආසන දෙව්මැදුර | ටී. එන්. වියන් සහ විල්සන් පීරිස් | 24th March | අංක 368/3A, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 |

### දෙවන සති අන්තය: 30th–31st March

| නැරඹුම් ස්ථාන | වාස්තු විද්‍යාඥයා | විවෘත දිනය | ලිපිනය |
|---|---|---|---|
| Ishq Colombo | චන්න දාස්වත්ත | 30th March | අංක 17/2, ඇල්ෆ්‍රඩ් පෙදෙස, කොළඹ 03 |
| MJF බටහිර මධ්‍යස්ථානය | නොදනී | 30th March | අංක 340, ගාලු ප්‍රධාන පාර, කටුබැද්ද, මොරටුව 10400 |
| බොරැල්ල සුසාන භූමිය | නොදනී | 31st March | අංක 475, බෞද්ධාලෝක මාවත, කොළඹ 08 |
| ජීවමාන ගැලවුම්කරු ක්‍රිස්තුස්ගේ ආසන දෙව්මැදුර | ටී. එන්. වියන් සහ විල්සන් පීරිස් | 31st March | අංක 368/3A, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 |

# ද සොයිසා නිවස



**ලිපිනය:**
අංක 61/5, ධර්මපාල මාවත
කොළඹ 07
හබීබ් බැංකුවට ඉදිරියෙන් (70, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 03) සහ අල්විස් පෙදෙසට හැරවූ පසු.

**පොදු ප්‍රවාහනය:** ධර්මපාල මාවතේ බස් නැවතුම (145, 176, 177 බස් රථ සඳහා) ඇත්තේ, නිවසින් පිටත් වූ තැනම ය.

**වාහන නවතා තැබීමේ පහසුකම් නොමැත.**

**වාස්තු විද්‍යාඥයා:** ජෙෆ්රි බාවා
**සේවාදායකයා:** ක්ලෝයි සහ සිසිල් ද සොයිසා
**වර්ෂය:** 1985-1991

→ වැඩි විස්තර

Image source:
Sebastian Posingis

ද සොයිසා නිවාසය නිර්මාණය කරන ලද්දේ, ක්ලෝයි ද සොයිසා මහත්මිය සහ ඇගේ සැමියා වන සිසිල් මහතා වෙනුවෙනි. සිය දරුවන් වෙන්ව ගිය පසු තම පවුලේ නිවහන ඔවුන් දෙදෙනාට ජීවත්වීම සඳහා පමණක් වුවත් ඉතා විශාල යැයි ඔවුහු සිතූහ. පවුලේ නිවහනට හරියට ම යාබදව සිටින සේ අනෙක් පසින් ස්ථානගත කිරීමෙන්, ක්ලෝයිගේ පෙර පටන් පැවති පැරණි ගෘහ භාණ්ඩ ද ඇතුළත් වන පරිද්දෙන් ජෙෆ්රි බාවා එම නිවස වෙනුවෙන් වූ සිය සැලසුම සැකසීය. බාවා, ද සොයිසා පවුලේ සමීප මිතුරෙකු වූ අතර, ඒනිසා නිවසට නිතර ආ ගිය අමුත්තෙකු වීය. තමා මොනර පිහාටුවලට කොයිතරම් ආදරය කළාද යන හේතුව නිසා, බාවා තමන්ට ලුණුගඟ උද්‍යානයෙන් මොනර පිහාටු මිටියක් රැගෙන ආ සැටි ක්ලෝයිගේ දියණිය ශාර්යා, දයාබරව සිහිපත් කරන්නීය.

'43 කණ්ඩායමේ' නිරූපණය කෙරෙන චිත්තාකර්ෂණීය බිතු සිතුවම ප්‍රදර්ශනය කෙරෙන පියගැටපෙළ, නිවසේ සෙසු කොටස් වන කියැවීමේ කාමරය, කෑම කාමරය, නිදන කාමරය, නාන කාමරය, විසිත්ත කාමරය සහ වහලෙහි ඇති උද්‍යානය වෙත යාමට අනුබලය සපයයි. මෙම නිවස බාවාගේ වෘත්තීය ජීවිතයේ අවසාන කාලයට ආසන්නව නිර්මාණය කර තිබුණ ද, එහි තවමත් ඒ ගෘහ නිර්මාණාත්මක අත්හදාබැලීම් ඇතුළත් ය. ද සොයිසා නිවස වනාහි බාවාගේ පළමු වානේ අත්හදාබැලීම වූයේය. එම අවකාශයට ආලෝකය රැගෙන ආ විසල් ජනේලවලින් වානේ නිමැවුම දක්නට ලැබිණි. ප්‍රතිඵලයෙන් තෘප්තියට පත් බාවා ඉන්පසු, ඔහුගේ නූතන අද්විතීය නිමැවුම වන කන්ඩලම හෝටල් ව්‍යාපෘතිය වෙනුවෙන් වානේ භාවිත කළේය.

බාවා නිවහනේ නිර්මාණය කළ උද්‍යාන අවකාශ, හරිතකරණයෙන් පිරවීම පිළිබඳව ක්ලෝයි මහත්මිය වගකීම දැරිය යුතු අතර, විශේෂයෙන් කෝවිඩ් කාලය තුළ දී ජීවත්වෙමින් සිටින බවට වන හැඟීම, එනම් 'කිසිදිනයක දී හුදෙකලා වූ බවක් හෝ ආවරණය කරගෙන සිටින ස්වභාවයක් නොදැනුණු බව' ඇයට දැනවීමට ඒවාට හැකිව තිබිණි.

# සාර නිල්ල



**ලිපිනය:**
අංක 30/8, 6 වන පටුමග, කොළඹ 05, කිරුළපන. ඩී. එම්. කොළඹගේ මාවත.

**පොදු ප්‍රවාහනය:** කිරුළපන දුම්රිය ස්ථානය (බහුවිධ දුම්රිය සේවා) සහ විවෘත විශ්වවිද්‍යාලය අසළ බස් නැවතුම (176) ආසන්නයේ පිහිටයි. කොළඹගේ මාවතේ සිට 6 වැනි පටුමගට හැරෙනවිට කෙලින් ම සාර නිල්ල වෙත පැමිණිය හැක.

**වාහන නවතා තැබීමේ පහසුකම් නොමැත.**

**වාස්තු විද්‍යාඥයා:** අමිල ද මෙල්
**උද්‍යාන සැලසුම:** කසාන වියරපුම
**සේවාදායකයා:** තුසිතා සහ හිරාන් ජයසුන්දර
**වර්ෂය:** 2022

→ වැඩි විස්තර

Image source:
Anusha Attygalle

සාර නිල්ල යනු, ශ්‍රී ලංකාවේ උපත ලැබ, බ්‍රිතාන්‍යයේ වෙසෙන රංගන ශිල්පිනියක වන තුසිතා ජයසුන්දර මහත්මිය විසින් ආරම්භ කරන ලද බහුකාර්ය, පුනර්ජනනීය සාමුහික අවකාශයකි. එය, 50 වැනි වියේ දී අභාවප්‍රාප්ත වූ නීතීඥයෙකු, වාග් විද්‍යාඥයෙකු සහ මානව හිමිකම් ක්‍රියාකාරිකයකු වූ ජයසුන්දරගේ සොහොයුරා වන හිරාන් මහතා වෙනුවෙන් කළ ජීවමාන උපහාරයකි. පෞද්ගලික හිමිකම සතු ඉඩමකට උරුම මෙම බිම්කැබැල්ලෙහි පළමුව 'පර්මාකල්චර්' ආකාරයේ උද්‍යානයක් නිර්මාණය කිරීමට සංකල්පගත කර තිබුණ නමුත්, 2022 උද්ගත වූ ඉන්ධන හිඟය එය ගැබිණි මව්වරුන් සහ කුඩා ළමුන් සඳහා ප්‍රජා මුළුතැන්ගෙයක් ඉදිකිරීම වෙනුවෙන් මෙහෙයවීය. පසුව එය, පුස්තකාලයක්/ කියැවීමේ ශාලාවක් සහ ඉංග්‍රීසි භාෂා ප්‍රතිග්‍රහණ මධ්‍යස්ථානයක් (ELAC) යන අංශ ද ඇතුළත් වන සේ පුළුල් කෙරිණි.

සාර නිල්ල ශ්‍රී ලංකාවේ පළමු පෞද්ගලික හිමිකම සහිත (ELAC) මධ්‍යස්ථානය වන අතර, දැනට එහි සාමාජික පිරිස 25ක් පමණ සිටිති. ඉගෙනුම වෙනුවෙන් පොළඹවනසුලු ඉංග්‍රීසි සැසි සහ සෙසු සම්පත් සඳහා ගාස්තු අයකරනු වෙනුවට, සාර නිල්ල, එම භූමියේ ක්‍රියාකාරකම් වර්ධනය කිරීමේ සහ පුළුල් කිරීමේ ක්‍රම ඉදිරිපත් කරමින්, දෙමව්පියන්ට සහ ළමුන්ට කරන ආපසු ගෙවීමක් වෙනුවෙන් ඇරයුම් කරයි.

ගෙවත්ත එළවළු (කංකුං, තක්කාලි, මිරිස්, බණ්ඩක්කා, ලූනු), ඔසු පැළෑටි(සේර, කරපිංචා, ගොටුකොළ) සහ පලතුරු (අඹ, කෙසෙල්, ගස්ලබු) මිශ්‍රිත වගාවකින් සමන්විත වේ. මෙහි දර්ශනයට සමගාමීව සහ 'මෙටා ගාඩ්න්' සංකල්පය අනුව මෙම උද්‍යානය සැලසුම් කර ඇත්තේ, උපචක්‍රීකරණය සඳහා නව්‍ය ක්‍රම රැසක් භාවිත වන පරිසර පද්ධතියක් ලෙසිනි. පාපැදි රෝදයක් ලීවරය ලෙස භාවිත වන පූර්ණ ක්‍රියාකාරී ළිඳක් ද ඊට ඇතුළත් ය. සාර නිල්ල, තමා වෙනුවෙන් කෙරෙන පරිත්‍යාග භාරගන්නා අතර, එහි සේවය පවත්වාගෙන යාමට ස්වේච්ඡාවෙන් සේවය කරන්නන් පිළිගනු ලැබේ.

# ගෝර්ඩන් උද්‍යාන



**ලිපිනය:** ජනාධිපති මන්දිරය, ජනාධිපති මාවත, කොළඹ 01.

**පොදු ප්‍රවාහනය:** ආසන්න ම බස් නැවතුම කොටුව (168) ය.

**උද්‍යාන සැලසුම්කරු:** ශ්‍රීමත් ආතර් ගෝර්ඩන්
**සේවාදායකයා:** වික්ටෝරියා මහ රැජින
**වර්ෂය:** 1887

→ වැඩි විස්තර

Image source:
© Rita McIntosh, 1930,
Flickr Creative Commons license

ගෝර්ඩන් උද්‍යානය, එම නාමය ලබාගත්තේ, වර්ෂ 1887 දී වික්ටෝරියා මහ රැජිණගේ ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් අක්කර තුනක ඉඩමක්, උද්‍යානයක් බවට පත්කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයෙකු වූ ශ්‍රීමත් ආතර් ගෝර්ඩන්ගෙනි. ගස්, මල් සහ උල්පත් උද්‍යානයේ භූ දර්ශනය නිමවුම් කරයි. එකල මේ භූමිය සැරසූ, වික්ටෝරියා රැජිනගේ කිරිගරුඬ ප්‍රතිමාව දැන් එතැනින් ඉවත් කර ඇත.

පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතිකයන්ට මෙරට යටත්විජිතයක්ව පැවති කාලයේ තමන්ගේ ම කතාන්දර සහිත ඉතිහාසයකින් උද්‍යාන භූමිය සමන්විත වේ. අක්කර තුනක උද්‍යානයක් සහිත වූ අක්කර 95ක භූමි ප්‍රදේශය, පල්ලි දෙකක්, සුසාන භූමියක් සහ ක්‍රිකට් සහ පාපන්දු තරග සඳහා වන ක්‍රීඩා පිටියක් ආදී විවිධ භූමිකා වෙනුවෙන් යළි යළිත් සේවය ලබා දී ඇත.

ගෝර්ඩන් උද්‍යාන ඇරඹුණේ පොදු ජන උද්‍යානයක් වශයෙනි. සත්‍ය වශයෙන් ම, එවකට කොළඹ නගරයේ එආකාරයෙන් පැවති පළමුවැන්න ලෙස උද්‍යානය නම් කෙරිණි. ජනාධිපති මන්දරයේ අණසක බලපවත්නා බලප්‍රදේශය යටතට පත්වන තුරු, එනම් 1980 වනතුරු මෙම උද්‍යානය පොදු උද්‍යානයක්ව පැවතිණි. ගෝර්ඩන් උද්‍යානය තවදුරටත් මහජනතාවට එහි පිවිසෙනු සඳහා ඉඩ ලබානොදේ.

# ලක්මහල් ප්‍රජා පුස්තකාලය



**ලිපිනය:**
8A, ඇල්ෆ්‍රඩ් නිවාස පාර, කොළඹ 03.

**පොදු ප්‍රවාහනය:** බම්බලපිටිය හන්දියේ බස් නැවතුම ඇත්තේ (බහුවිධ බස් රථ සේවා) විනාඩි දහයක ඇවිදින දුරකිනි.

**වාහන නවතා තැබීමේ පහසුකම් නොමැත.**

**වාස්තු විද්‍යාඥයා:** නොදනී
**සේවාදායකයා:** සිරිල් ලෙනාඩ් වික්‍රමසිංහ
**වර්ෂය:** ඉදිකිරීම 1937; ප්‍රතිසංස්කරණය 2019-2021.

→ වැඩි විස්තර

Image source:
Rajiva Wijesinha

පුස්තකාලයක් සහ ප්‍රජා අවකාශයක් බවට පරිණාමය වීමට පෙරාතුව ලක්මහල් ඇරඹියේ වික්‍රමසිංහ පවුලේ නිවාසයක් ලෙසිනි. මෙම නිවස කරවන ලද්දේ සිරිල් ලෙනාඩ් වික්‍රමසිංහ මහතා සහ ඔහුගේ භාර්යාව වූ එස්මේ(විවාහයට පෙර මූණමලේ ගුණවර්ධන) විසිනි. එස්මේ මහත්මිය 1994 වසරේ දී අභාවප්‍රාප්ත වන තුරු ම ලක්මහල්හි ජීවත් වූවාය.

යටත්විජිත කාලයේ ගොඩනැගූ විසල් නිවාස නම්කිරීමේ පුරුද්ද අනුව මෙම නිවස නම් කර තිබේ. එහෙත් පවුලේ සාමාජිකයන්ට වුවමනා වූයේ, “වඩාත් ශ්‍රී  ලාංකික බව” හැඟෙන ආකාරයට “ලංකා” සහ “ටජ් මහල්” යන නාමයන් එක්කර එය “ලක්මහල්” ලෙස නම්කිරීමට ය. පුස්තකාල බිත්තියේ එල්ලා ඇති පවුලේ විශාල ඡායාරූප එකතුවක්,  මෙහි පොදු අවකාශය සහ පෞද්ගලික නිවාසය අතර බෙදුම නිර්ණය කරයි. මෙය තුන්වෙනි පරපුරේ හිමිකරුවන් අතර බෙදා වෙන්කර දෙනු ලැබීමට පෙර පැවතුණු වඩාත් විශාල මුල් ගොඩනැගිල්ලේ කොටසක් ලෙස තවමත් පවතී. මෙම බෙදීම සිදුකරනවිට, ගෘහ නිර්මාණ ශිල්පයට හානි පැමිණවීමෙන් වළකාලීම, විශේෂයෙන් ප්‍රමුඛ කරගැනිණි.

ලක්මහල් ප්‍රජා පුස්තකාලයේ නිර්මාතෘවරිය වන, අනීෂා ඩයස් බණ්ඩාරනායක මහත්මිය, පොත් කියැවීම, අධ්‍යාපනය සහ ප්‍රජා දිරිගැන්වීම් සහිත සාමූහික එක්රැස්වීමේ අවකාශයක් කොළඹ නිර්මාණය කිරීමට උත්සාහ කළාය. අධ්‍යයන අවකාශයන්ට සහ බැහැරදෙන පොත් විශාල සංඛ්‍යාවකට අමතරව ලක්මහල්හි නිතිපතා විවිධ උත්සව පැවැත්වේ. ලක්මහල් පුස්තකාලය පොත් පරිත්‍යාග බාරගනු ලැබේ.

ලක්මහල් ප්‍රජා පුස්තකාලය, පවුලේ සාමාජිකයන්ගේ සහයෝගයේ ප්‍රතිඵලයක් වූ නිමැයුමකි. අනීෂාගේ පියා එහි ව්‍යුහාත්මක අවශ්‍යතා සපුරාලීම භාරගත් අතර, ඇයත් ඇගේ මවත් එක්ව ගෘහ අභ්‍යන්තරය සැලසුම් කළහ.  ඇගේ සොහොයුරා එම අවකාශය වෙනුවෙන් ආලෝකය නිර්මාණය කිරීමත්, පැළ සිටුවීමත් සිදුකළේ ය. ඇගේ මව විසින් නගින්නට යෙදුණු, අනීෂාට සිහිපත්වන ආකාරයට, ඇය කුඩා දැරියකව සිටි අවදියේ දී සිය පියා සමඟ පෙති හයක මල් හොයමින් කල් ගෙවූ, විශාල අරලියා ගසක් යට සිටින සේ මේ සියල්ල, සකසා ඇත. බාහිරින් වර්ණ ගන්වන ලද අද්විතීය රෝස තීන්ත පැහැය එනම් “සැප්තැම්බරයේ අරුණෝදය,” නිවස පටන්ගත් දා සිට තවමත් වෙනස්ව නැත.

# ජීවමාන ගැලවුම්කරු ක්‍රිස්තුස්ගේ ආසන දෙව්මැදුර



**ලිපිනය:**
අංක 368/3A, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**පොදු ප්‍රවාහනය:** විජේරාම/BMICH බස් නැවතුම (154) ඇත්තේ එම භූමියෙන් පිටතට බසින තැනමය.

**වාස්තු විද්‍යාඥයා:** ටී. එන්. වියන් සහ විල්සන් පීරිස්
**සේවාදායකයා:** කොළඹ විශ්‍රාමික රදගුරු, අතිගරු හැරල්ඩ් ද සොයිසා හිමිපාණන්
**වර්ෂය:** 1945-1968

→ වැඩි විස්තර 1 / 2

Image source:
Rippleworth

මේවනවිට කොළඹ ප්‍රධාන ම බිම් පෙදෙසක් සේ සැලකෙන තැනක පිහිටා ඇති, ජීවමාන ගැලවුම්කරුවා වන ක්‍රිස්තුස්ගේ ආසන දෙව්මැදුර මීට පෙර පිහිටියේ, ජාතික බෝවන රෝග විද්‍යායතනය පිහිටි භූමියේ ය. ඒ කාලයේ තිබූ මුල් නිවහන, මේවනවිට සිටින රදගුරුතුමාගේ වන අතර, ඊට පෙර එය එහි සිටි පළමු අගරදගුරුතුමාගේ විය.

දෙව්මැදුර පසුපසින් පිහිටි කුඩා නිවාස පේළියෙහි විශ්‍රාමික පූජකවරුන් සහ ඔවුන්ගේ පවුල් පදිංචිව සිටින අතර, විහිද පැතිර පවතින එම භූමියේ පිටුපසින් නුග ගසක් සමඟ පිහිටි රංගපීඨයක් ද සැඟව පවතී. මෙම භූමියේ ඇති උද්‍යානය, රට පුරා පවතින දුර්ලභ තුරුලතා පැළෑටි එකතුවකින් සමන්විත අතර, එම බිම්පෙදෙස වටා භාවනානුයෝගීව සිටීමට වුවමනා වෘත්තාකාර සක්මන් මළුවක් ද වෙයි.

දේශීය උඩරට ගෘහ නිර්මාණ ශිල්පය සහ උඩරට හා උතුරු භූ දර්ශන සහිත බිතුසිතුවම් ඇතුළු ශ්‍රී ලාංකේය ආභාසයන් සඳහා මෙම දෙව්මැදුර සුවිශේෂ අද්විතීයක් උසුලයි. මෙම සෞන්දර්යාත්මක ලක්ෂණ, ප්‍රජා අදහස් සහ යටත්විජිතවාදයෙන් ස්වාධීන යැයි හැඟෙන අවකාශයකට පිවිසීමට ඇති ආශාවේ ප්‍රතිඵලයකි. පල්ලියේ සීනුව ගාල්ලේ නැවකින් ලබාගත්තකි.

ආසන දෙව්මැදුරෙහි ඉදිකිරීම් කටයුතු මේ දක්වා නිමකර නැතියෙන් ඉතිරිව පවතී; පල්ලියේ කටයුතු අවසන් කරන කාලය වනවිට රටේ සංවෘත ආර්ථිකයක් පැවති අතර, ව්‍යාපෘතියට අරමුදල් ලැබුණේ කෙසේද යන්න ගැන සැකයක් උද්ගත කළේය. ජෝර්ජ් කීට් සහ බාබරා සන්සෝනි ඇතුළු දේශීය කලාකරුවන්ගේ කලාකෘති ඇතුළත් කිරීමේ අදහසින් සැලසුම් කරන ලද ආසන දෙව්මැදුර, එකල දකුණු ආසියානු දේවස්ථාන අතරින් වඩාත් ම අද්විතීය එකක් වන්නට ඇත.

# Ishq Colombo



**ලිපිනය:**
අංක 17/2, ඇල්ෆ්‍රඩ් පෙදෙස, කොළඹ 03.

**පොදු ප්‍රවාහනය:** ඇල්ෆ්‍රඩ් පෙදෙසේ බස් නැවතුම(බහුවිධ බස් රථ සේවා) ඇත්තේ, ඩුප්ලිකේෂන් පාරට ඉතා ම ආසන්නයේ ය.

**වාහන නවතා තැබීමේ පහසුකම් නොමැත.**

**වාස්තු විද්‍යාඥයා:** චන්න දාස්වත්ත
**සේවාදායකයා:** හනීෆ් යූසුෆ්
**වර්ෂය:** ඉදිකිරීම 2003-2004; ප්‍රතිසංස්කරණය 2015-2018

→ වැඩි විස්තර

Image source:
Ishq Colombo

Ishq Colombo වනාහි, කොළඹ ජනාකීර්ණ ඩුප්ලිකේෂන් පාරෙන් එහා හරිත පැහැයෙන් ආවරණය වූ ගේට්ටුවට ඔබ්බෙන් පිහිටියා වූ, 'බුටීක් විලා' වර්ගයේ ගොඩනැගිල්ලක් බවට පරිවර්තනය කළ පවුල් නිවසකි. මැද මිදුල නිවසේ කේන්ද්‍රය වන අතර, එමගින් නිවස පුරා සැරිසැරීමේ අත්දැකීම හැඩගස්වනු ලබයි. එය මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාවේ ගෘහ නිර්මාණාත්මක ශිල්ප ලක්ෂණවලට සමාන ය. විශේෂයෙන් ඉෂ්ක්ගේ නිවාස සැලසුම සිරියාවේ ඩමස්කස්හි නගර නිවාසයකට අනුව හැඩගස්වා ඇති අතර, ජෙෆ්රි බාවාගේ අගා ඛාන් සම්මානය (Aga Khan award) රැගෙන ඒම සඳහා, සිය මිතුරු වාස්තු විද්‍යාඥයෙකු වූ සී. අංජලේන්ද්‍රන් මහතා සමඟ එහි කළ සංචාරයේ දී වාස්තු විද්‍යාඥ චන්න දාස්වත්තයනගේ අවධානයට එය ලක්ව තිබිණි.

යූසුෆ් පවුල වෙනුවෙන් පළමුව ඉදිකළ සහ ඔවුන්ගේ භාවිතයට ගැනුණු මෙම නිවස, එයින් වසර 10කට පමණ පසු, ආගන්තුක සත්කාර අරමුණු පෙරදැරිව ප්‍රතිසංස්කරණයට ලක්කෙරිණි. ප්‍රධාන සුඛෝපභෝගී විසල් නිදන කාමර දෙකක් ඇතුළු නිදන කාමර තුන, බිම් මහලේ විසිත්ත කාමරය, කෑම කාමරය, පුස්තකාලය සහ උඩු මහලේ විසිත්ත කාමරය යන මේවායින් නිවස සමන්විත වේ. පවුලෙහි පෞද්ගලික සංස්පර්ශීය ලක්ෂණ සැමතැනක ම දක්නට ඇත. යූසුෆ් මහතා විසින් වෙන්දේසියක දී මිලදී ගත්, කොළඹ ඉපැරණි ඡායාරූප එකතුවක් දෙවන මහලේ බිතු සොබාව අලංකාර කරන අතර, යූසුෆ් මහත්මිය ගෙවතු වගාවේ වැඩි කොටසක් පාලනය කරන්නට වූයේ, 'ගොඩනැගිලි යනු ඇත්ත වශයෙන් ම දැකීමට ඇති දෙයක් නොව, ජීවත්වීමට ඇති දෙයකි' ය යන දාස්වත්තගේ විශ්වාසය හා සමපාත වෙමිනි. නිවසේ ඉතිහාසය සලකා බැලීමේ දී, පවුලෙන් ඒ වෙත ලද සහයෝගය සහ දායකත්වය, එහි නම හා සමානව ම එය අර්ථ දක්වයි: Ishq යනු ආදරය සඳහා වන අරාබි වචනයයි.

# MJF බටහිර මධ්‍යස්ථානය (MJF Centre West)




**ලිපිනය:**
අංක 340, ගාලු ප්‍රධාන පාර, කටුබැද්ද, මොරටුව 10400.

**පොදු ප්‍රවාහනය:** කටුබැද්ද බස් නැවතුම (බහුවිධ බස් රථ සේවා) ඇත්තේ MJF මධ්‍යස්ථානයට හරවන තැන ඉදිරියෙනි.

**වාහන නැවැත්වීමේ පහසුකම් ඇත.**

**වාස්තු විද්‍යාඥයා:** නොදනී
**සේවාදායකයා:** නොදනී
**වර්ෂය:** ආයතනය පිහිටුවීම 2010

→ වැඩි විස්තර

Image source:
MJF Centre

MJF බටහිර මධ්‍යස්ථානය වනාහි, ශ්‍රී ලංකාව පුරා පවතින මෙරිල් ජේ. ප්‍රනාන්දු පුණ්‍ය පදනම් 13ක ප්‍රධාන ම මධ්‍යස්ථානයයි. දශකයකට පමණ ඉහත දී පැවති ඇඟලුම් කම්හල් භූමියක ආරම්භ කරනු ලැබ, කලකට පෙර අත්හැර දමනු ලැබූ මෙම බිම්කඩ මේවනවිට සමෘද්ධිමත් සාමූහික ප්‍රජාවක් වෙත ඇප කැප වූ ඉඩ අවකාශයක්ව පවතී.

MJF බටහිර මධ්‍යස්ථානය දෙමාපිය කටයුතු සහ මූල්‍ය කළමනාකරණ වැඩමුළු, මැහුම්වැඩ, වඩු වැඩ, ගමන්මලු සෑදීම, ගණිත උපදෙස්, භෞතික චිකිත්සක ප්‍රතිකාර, ආගන්තුක සත්කාරය පිළිබඳ අධ්‍යාපනය ඇතුළු තවත් බොහෝ දෑ සහිතව, සතියේ දිනවල විවිධත්වයෙන් යුතු වැඩසටහන් ක්‍රියාවට නැංවීම හරහා ප්‍රජා සමූහයේ සිටින පෙරපාසල් අවධියට පෙර සිට තරුණවිය දක්වාත්, අඩු පහසුකම් සහිත කාන්තාවන් සහ තරුණයින් පිළිබඳවත් මූලික වශයෙන් අවශ්‍යතා සොයාබලයි. කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වය වැඩිදියුණු කිරීමේ සිට විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා දීර්ඝකාලීන වෘත්තීය අවස්ථා වර්ධනය කිරීම දක්වා වූ ස්වතන්ත්‍රතාවක් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි මේ සියලු මූලික මුලපිරීම් අවධානය යොමවයි.

විශේෂයෙන් නිමවන ලද පන්ති කාමරවලට අමතරව (සංවේදක කාමරයක් ඇතුළුව), අක්කර නවයක් පුරා පවතින මෙම භූමියෙහි අක්කරයක කාබනික ගොවිළක්, සමනල් උයනක්, තුරු උයනක්, තොරතුරු තාක්ෂණික විද්‍යාගාරයක්, නේවාසිකාගාරයක්, ප්‍රජා පුස්තකාලයක්, අවන්හලක්, සංවේදක උද්‍යානයක්, සූපශාස්ත්‍ර උගන්නා පාසලක්, ගණිත ඉගෙනුම් මධ්‍යස්ථානයක්, ඔසු උයනක්, වඩු වැඩපළක් සහ භෞතික චිකිත්සක සත්කාර ඒකකයක් පවතී. තුරු සහ පැළෑටි විශේෂ 300කින් සමන්විත තුරු උයන ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල දැකිය හැකි එආකාරයේ පළමුවැන්න වන අතර, සමනල උයනේ ඇති විවිධ උද්භිත ශාක විශේෂ 60කට වැඩි ප්‍රමාණයක් ඒ කෙරේ සිත් ඇඳබැඳ තබාලයි. ප්‍රාසාංගික රැඟුම්, කුඩා වෙළෙන්දන්ට සිය අත්කම් සහ ආහාර නිෂ්පාදන අලෙවි කිරීම සඳහා පවත්නා රාත්‍රී වෙළඳපොළක් සහ පොත් කියැවීමේ සැසි ආදි විශේෂ අවස්ථා ද මෙම අවකාශය විසින් පවත්වාගෙන යනු ලැබේ.

# බොරැල්ල සුසාන භූමිය



**ලිපිනය:** අංක 475, බෞද්ධාලෝක මාවත කොළඹ 08.

**පොදු ප්‍රවාහනය:** The House of Fashion බස් නැවතුම (බහුවිධ බස් රථ සේවා) ඇත්තේ විනාඩි පහක ඇවිදින දුරකිනි.

**වාස්තු විද්‍යාඥයා:** නොදනී
**වර්ෂය:** 1866

→ වැඩි විස්තර

Image source:
© John Falconer, 2008,
Flickr Creative Commons license

කොළඹ ප්‍රධාන සුසාන භූමිය වශයෙන්, විසල් බිමක විහිද පවතින බොරැල්ල කනත්ත හින්දු, බෞද්ධ,  ශින්ටෝ, රෝමානු කතෝලික, ඇන්ගලිකන් සහ නිර්-නිකායික ක්‍රිස්තියානි ඇතුළු විවිධ ඇදහිලි ගණනාවක බැතිමතුන් වෙනුවෙන් වෙන්කළ අංශවලින් සමන්විත වන අතර, ඊට අමතරව ආදාහනාගාර හතරකට ඉඩපහසුව සලසයි. පවත්නා අනේකවිධතාවයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම සුසාන භූමිය හරිත සහ විස්තීර්ණ ආදාහන බිම් පෙදෙසක මුසුවීමක් හරහා තමා වෙනුවෙන් ම සුවිශේෂ භූ ලක්ෂණ සකසාගනී. මෙය, කොළඹ වෙසෙන ජනතාවට සහ කීර්තිමත් පුද්ගලයන් වෙනුවෙන් අවසන් ගිමන් හැරීමට ඇති ස්ථානයකි. බොරැල්ල කනත්ත එහි 120,000+ක් වන සොහොන් අතරින් කොටසක් ලෙසින්, යුද්ධයෙන් මිය ගිය මිනිසුන් වෙනුවෙන් 300කට අධික සොහොන් ප්‍රමාණයක් ද පවත්වාගෙන යයි.

මෙම සුසාන භූමිය, කොළඹ අවට ප්‍රදේශයේ එම නමින් ම පිහිටා ඇති නිසා කටවහරට අනුව බොරැල්ල කනත්ත ලෙසින් හැඳින්වේ. කොළඹ මහනගර සභාව මේ වනවිට එහි හිමිකාරිත්වය දරමින් නඩත්තු කරයි. කොළඹ ගොඩනැගිලි ඉදිකිරීම් ලක්ෂණ සහ ස්වාභාවිකත්වය ඉක්මවූ කුප්‍රසිද්ධියට අදාළ එහි භූමිකාව හේතුවෙන් ප්‍රදේශවාසීන් සහ ආගන්තුකයන් සඳහා මෙය ජනප්‍රිය ගමනාන්තයක්ව තිබේ.